


සිදුහත් බෝසතාණන් බුදු පදවි ලද **බුද්ධගයාව**

### ඃ ප්‍රථම සංඝ සමුළුව පැවැති නවම් පොහොය

– කරව්වේ විජයතිස්ස නාහිමි
සැරියුත් – මුගලන් මහ තෙරුන්ට බුදුසසුනේ අගසව් තනතුරු පිරිනැමුණු නවම් පෝය දිනෙකදී පැවැති ගෞතම බුදු සසුනේ ප්‍රථම මහා සඟ සමුළුව පිළිබඳ ඉතිහාසගත තොරතුරු පැහැදිලි කිරීමට දරන ප්‍රයත්නයකි.

### ඃ යුද හා අපරාධ නැති ලොවකට පිවිසෙන මඟ බුදුසමය පෙන්වයි

– නිර්මලා අමරසිංහ
යුද්ධය හා අපරාධය පැතිරෙමින් පවතින ලෝක සමාජ වටපිටාවක් තුළ, එම සමාජ ගැටලු වලට පිළිතුරු – දහම තුළින් ලබාගැනීමට දරන ලද උත්සාහයක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය. මිනිස් මනස තුළ පහළවන යුද්ධයේ සහ අපරාධයේ මූලබීජ හඳුනාගෙන – ඒවා ඉවත් කිරීම සඳහා බුදුදහමෙන් ලැබෙන මඟපෙන්වීම පැහැදිලි කරගැනීමයි, ලේඛකයාගේ උත්සාහය වී ඇත්තේ.

### ඃ බුදුදහමේ ගැබ්වන ධර්මෝපදේශ පූර්ණ පෞරුෂ වර්ධනයට මඟයි

– රෙජී වීරමන්
පෞරුෂ වර්ධනය සඳහා බුදු දහමෙන් ලබාගත හැකි ධර්මෝපදේශ සහ බටහිර මනෝවිද්‍යාවේ ඒ පිළිබඳ ඉගැන්වීම් ගැන සිදුකැරෙන විමර්ශනයකි.

### ඃ අලව්ව ආඬියාදෙණිය නුගවෙල පුරාණ විහාරස්ථානය

– දර්ශී කලුබෝවිල
කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්ව ප්‍රදේශයේ සිට නාරම්මල දක්වා දිවෙන මාර්ගයේ අතරමගදී හමුවන ආඬියාදෙණිය ප්‍රදේශයේ පිහිටි ඉපැරැණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.

### ඃ කඳුබොඩ භාවනා මධ්‍යස්ථානය

– ජනක වෙත්තසිංහ
කොළඹ පැලියගොඩ නුවර පාරෙන් ඇරැඹෙන බියගම පාරෙන් දෙල්ගොඩට ගොස් එතැනින් ළඟාවිය හැකි ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආරණ්‍යයක් ලෙස සැලකිය හැකි විපස්සනා භාවනා මධ්‍යස්ථානයක් පිළිබඳ තොරතුරු මෙම ලිපියෙන් හෙළිකැරේ.

### ඃ දම් අමා රස

– නුගවෙල ප්‍රඥාජෝති නාහිමි
ධම්මපදය නම් වූ සුප්‍රකට ඉපැරැණි බෞද්ධ ග්‍රන්ථයේ සඳහන් වන; ගිහි – පැවිදි කාටත් එක සේ මඟ පෙන්වන වැදගත් ගාථා පාඨවල අර්ථ – සිංහල භාෂාවෙන් පැහැදිලි කැරෙන විශේෂාංගයකි.

### ඃ කාල කළමනාකරණයේ අගයබුදු සිරිතෙන් දකිමු

– කුඩගම්මන සීලරතන හිමි
ආර්ථික දුෂ්කරතා සහ සංකීර්ණ සමාජ රටවක් තුළ තමන්ගේ සීමිත කාලය නිසි ලෙස කළමනාකරණය කරගැනීම සඳහා උනන්දු වන වත්මන් යුගයේ මිනිසුන්ට බුදුදහමෙන්, හා බුදු සිරිතෙන් ඒ පිළිබඳ ලබාගත හැකි පාඩම්.

### ඃ බ්‍රහ්මාති මාතා පිතරෝ

– ගංගොඩවිල සෝමහිමි
මවුපිය – දූ දරු සබඳතා විධිමත් විය යුතු අයුරු මවුපිය ගුණ මහිම හා යහපත් සමාජ සංස්ථාවක් ගොඩනැගීමෙහිලා යහපත් මවුපිය – දූ දරු සබඳතා ගොඩනැංවීමෙහි වැදගත්කම.

### ඃ සදහම් දැනුම

– වහුමුවේ විජයවංස නා හිමි

## ෴ සැමට ශාන්තිය ලබාදෙන නාථ මෙත් බෝසතාණෝ

– මහාචාර්ය ඩබ්ලිව්. එස්. ප්‍රනාන්දු

ගෞතම බුදු සසුනෙන් පසු ‘මහා භද්‍ර කල්පය’ නමින් හැඳින්වෙන කාල සීමාව තුළදීම මීළඟට බුද්ධත්වයට පත්වීමට නියමිත බෝධි–සත්වයන් ලෙස සැලසෙන මෛත්‍රී බෝධිසත්වයන් වහන්සේ පිළිබඳ ශාසන ඉතිහාසගත තොරතුරු.

## ෴ මාරයාට පහරදිය හැකි ආයුධය

– දිවියගහ යසස්සි නාහිමි

රාගාදී කෙලෙස් නැතිකිරීම සඳහා බුදු දහමේ දක්වෙන භාවනා ක්‍රම මගින් ශරීරයේ යථා ස්වභාවය පිළිබඳ ඇතිකර ගත යුතු අව–බෝධයේ වැදගත්කමයි, සාර්ථක ජීවිතයකට කුඩා ලිපියෙන් හෙළිදරව් කැරෙන්නේ.

## ෴ බෞද්ධයාගේ මෝක්ෂය නිවනයි සත්ව පරිණාමයේ කෙළවරත් එතැනයි

– පිටිදූවේ සිරිධම්ම හිමි

විශ්වයේ පැවැත්ම පිළිබඳ විද්‍යාඥයන්ගේ අදහස් සමග බෞද්ධ මෝක්ෂ මාර්ගයේ ප්‍රායෝගිකත්වය විමසුමට ලක්කිරීම මෙම ලිපිය ලියූ ලේඛකයාගේ අරමුණ වී ඇති බව පෙනේ

## ෴ Dhamma is our daily life

*-by Bogoda Premaratne*